3rd Proof

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2297/79 - 2022 සැප්තැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ,
සහ ජාතික ප්‍රතිපත්ති, අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි ''**2022 අංක 15 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**'' ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

3. 2022 ජුනි මස 24 දිනැති අංක 2285/19 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් සංශෝධිත, 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 4 (ඇ) රෙගුලාසිය ප්‍රකාරව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය

1A - PG 5981 — 406 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මත ආනයනය කරන ලද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, වරායට/ගුවන්තොටුපළ වෙත පැමිණෙන දිනය, පහත සඳහන් පරිදි දීර්ඝ කරනු ලැබේ.

i. සංශෝධිත 2022 අංක 10 දරන ගෙවීම් නියමයන් පිළිබඳ ආනයන පාලන රෙගුලාසිවල **I වන උපලේඛනයෙහි 0402.21.00 සහ 0713.40.11 යන එච්. එස්. සංකේතයන්** යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, එම භාණ්ඩ 2022 ඔක්තෝබර් 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ වරායට/ගුවන් තොටුපළ වෙත පැමිණීමට පෙර ලබාගන්නා ලද වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, විවෘත ගිණුම්/භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

ii. ඉහත 3 (i) හි සඳහන්කර ඇති භාණ්ඩ හැර **එකී රෙගුලාසිවල I වන උපලේඛනයෙහි** නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, එම භාණ්ඩ 2022 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ වරායට/ගුවන් තොටුපළ වෙත පැමිණීමට පෙර ලබාගන්නා ලද වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, විවෘත ගිණුම්/භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

4. සංශෝධිත 2022 අංක 10 දරන ගෙවීම් නියමයන් පිළිබඳ ආනයන පාලන රෙගුලාසිවල **I වන උපලේඛනයෙහි 0402.21.00 සහ 0713.40.11 යන එච්. එස්. සංකේතයන්** යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය, සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල 6 වන රෙගුලාසියෙන් නිදහස් කරනු ලැබේ.

5. ලියාපදිංචි කුකුළු ආහාර නිෂ්පාදකයින්ට කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍යවන **බඩඉරිඟු (එච්. එස්. 1005.90.00) සහ සෝයා බෝංචි ආහාර (එච්. එස්. 2304.00.00)**, එම භාණ්ඩ 2022 ඔක්තෝබර් 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ වරායට/ගුවන් තොටුපළ වෙත පැමිණීමට පෙර ලබාගන්නා ලද කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, විවෘත ගිණුම්/භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

6. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත අංක 3 දරන රෙගුලාසි උල්ලංඝනය කරමින් සිදුකරන ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් සහ ඉහත රෙගුලාසි අංක 5 උල්ලංඝනය කරමින් සිදුකරන ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.